**කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලය වැඩිදියුණු කිරීම පිළිබඳ ව්‍යාපෘතිය - 2017**

---

කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලය වැඩිදියුණු කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා කොරියානු අපනයන - ආනයන බැංකුව අතර 2013 ජුලි 23 දින එළඹි අංක 2013033/එස්එල්-එස්ආර්අයි-22 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව, එවකට තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, කොළඹ හා ගම්පහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය 02 ක් පිහිටුවීම හා සංවර්ධනය කිරීම සහ තාක්ෂණික මාරු කිරීම් හා ආර්ථික සංවර්ධනයේදී කොරියානු විශේෂඥයින්ගේ සහය සහිතව කර්මාන්ත වර්ධනයට අනුබල දීම හා මානව සම්පත් සංවර්ධනයේදී ප්‍රධාන කාර්ය භාරයක් සිදු කිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 31.41 ක් හෙවත් රු.මිලියන 4,172 ක් වන අතර ඉන් එජඩො මිලියන 26.05 ක් හෙවත් රු.මිලියන 3,460 ක් කොරියානු අපනයන - ආනයන බැංකුව විසින් මූල්‍යානය කිරීම සඳහා එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2013 නොවැම්බර් 18 දින ආරම්භ කරන ලද අතර 2016 නොවැම්බර් 18 වන විට නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවස්ථා 02කදී 2018 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනිම ආදිය දැක්වෙන පරිදි අඛන්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගෙන යනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමණාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2017 වර්ෂය සඳහා වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ඊඩීසීඒෆ් | 26.05 | 3,461 | 3.85 | 1.69 | 219.60 | 8.28 | 1,076.60 |
| ශ්‍රීලංර | 5.36 | 711 | 0.92 | 0.50 | 65.50 | 0.86 | 112.00 |
| | 31.41 | 4,172 | 4.77 | 2.19 | 285.10 | 9.14 | 1.188.60 |

## 3.2 භෞතික ප්‍රගතිය

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ආරම්භක දිනය වූ 2013 නොවැම්බර් 19 දින සිට මාස 36 ක් ඇතුලත ව්‍යාපෘති කාර්යයන් සම්පූර්ණ කලයුතුව තිබුණි. කෙසේ වුවද, උපදේශකවරුන් හා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම සහ ඒවා ඵලදායී ලෙස මෙහෙයවීම සඳහා සහ ව්‍යාපෘතියේ අනෙකුත් කාර්යයන් වන උපකරණ මිලදීගැනීම, පෙළපොත් සංවර්ධනය, කළමනාකරුවන්ට හා උපදේශකයින්ට විදේශීය පුහුණු ලබාදීම ආදිය ප්‍රමාද වීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමට සිදුව තිබුණි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ කාර්යයන් සම්බන්ධයෙන් සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 46 ක්ව පැවතුණි. එසේම කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු 2018 ජුනි 29 දිනෙන් අවසන් කිරීමට අපේක්ෂිතව තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වනවිට එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 34ක් හා සියයට 24ක්ව පැවතුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, පෙළපොත් සංවර්ධනය 2017 සැප්තැම්බර් 30 දින සම්පූර්ණ කිරීමට අපේක්ෂිතව තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් සම්පූර්ණ කර තිබුණේ එහි කාර්යයන්ගෙන් සියයට 50 ක් පමණි.

## 3.3 මානව සම්පත් කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව රු.100,000 ක මාසික වැටුපකට 2017 මාර්තු සිට සිවිල් ඉංජිනේරු තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. කෙසේවුවද, 2015 මැයි 07 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් සිවිල් ඉංජිනේරුගේ රාජකාරී අමාත්‍යාංශයේ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියට අනුමත කරන ලද අතිරේක කාර්යමණ්ඩලය මගින් ආවරනය කරගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 10 දින බඳවාගන්නා ලද ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත 2016 මාර්තු 26 දිනැති අංක 1/2016 දරන චක්‍රලේඛයේ 2.2.5 (අ) ඡේදයේ දක්වා ඇති පරිදි ප්‍රමාණවත් පලපුරුද්දක් නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම 2017 ජනවාරි 16 දින බඳවාගත් තාක්ෂණ නිලධාරී උක්ත සඳහන් චක්‍රලේඛයේ 2.2.9 ඡේදය ප්‍රකාරව ලබා ගතයුතු ජාතික වෘත්තීය සුදුසුකම සපුරා නොතිබුණි.

**3.4 මූල්‍ය පාලන පිළිබඳ ගැටළු**

**--------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 134 (3) හා 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳව රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයට භාජනය කර නොතිබුණි.